

# කොඩියගෙ ළම

ලක්ෂමන් කොඩිතුවක්කු

# උපසේනගේ ඇට පුරුක්

**"මෙහි එන සෑම කෙටි කතාවක්ම පාහේ සැබෑ ජීවන අත්දැකිම් පරිකල්පන යාන්ත්‍රණය තුළ වෙනත් හැඩයක් ගනිමින් නිර්මාණයක් බිහිවන අයුරු වටහාගන්නට අප යොමු කරවයි. කෙටි කතාව නමැති සියුම් මාධ්‍යයට පෙම් බැඳ සිටින කතාකරු මේ කතා මඟින් අපට මුණ ගස්වන බොහෝ චරිත මනුෂ්‍යත්වය මෙයයැයි කියාපායි. මිනිස්කම වේගයෙන් පිරිහෙන අද දවසේ මෙම කතා මගින් පාඨකයාට යෝජනා කරන්නේ තම අභ්‍යන්තරයට හැරී හෘද සාක්ෂිය විමසන ලෙසයි."**

ඩබ්.එම්. උපසේනගේ අලුත්ම කෙටි කතා සංග්‍රහය වන ඇට පුරුක් හි පසුවදන ක් ලියා තබන ප්‍රවීන ලේඛක ජයතිලක කම්මැල්ලවීරයන් ඉහත වදන් මගින් පාඨකයාට ලියා තබන්නේ සාහිත්‍යය ලේඛණයක් තුළින් මනුෂ්‍යත්වයට අමතන නිර්මාණශීලි නිර්ව්‍යාජ ලේඛකයෙකුගේ ගමන්මඟ පිළිබඳවයි. මනුෂ්‍යත්වය වඳවී යන මේ විශ්වය තුළ එය රැකගන්නට, සාහිත්‍ය නිර්මාණයකට කළ හැකි කාර්යබාර්ය පිළිබඳවයි. මනුෂ්‍යත්වයේ සුවඳින් පිරි අත්දැකීම් ගොන්නක් රැගෙන තම සාහිත්‍යය භාෂණය තුළින් නැවතත් කතුවරයා අප අතරට එන්නේ ඇට පුරුක් හරහාය. මීට පෙර කෙටි කතා සංග්‍රහ තුනක් පමණ පළ කර ඇති උපසේනගේ ඇට පුරුක් කෙටි කතා සංග්‍රහය සරල බසකින් ලියවී ඇති සැමටම රසවිඳිය හැකි අපූර්තවයෙන් පිරි ග්‍රන්ථයක් බව මගේ නිගමනයයි.

කෙටි කතා පහළොවකින් සමන්විත ඇට පුරුක් කෙටි කතා සංග්‍රහය ප්‍රවීන ලේඛකයකුගේ සැබෑ දෘෂ්ටිය හා සමපාතවී යථාර්ථවාදී රීතිය මැනවින් ග්‍රහණය කරගනිමින් ප්‍රබන්ධ වී ඇති අගනා කතා සාහිත්‍ය සංග්‍රහයකි. කාලයක් පුරා වික්ටෝරියා ප්‍රාන්තයේ ජීවත් වෙමින් සාහිත්‍යකරණයේ යෙදෙන ඩබ්.උපසේන මෙල්බන් පුරවරයේ සිංහල පුවත්පත් හි තිරුලිපි රචකයෙකි. එමෙන්ම ඔහුගේ බොහෝ කෙටි කතා සිංහල පුවත්පත් තුළින් වරින් වර අප රසවිඳ ඇත. තම ලේඛන අනන්‍යතාව තුළින් ඔහු සිංහල ඩයස්පෝරා සාහිත්‍යට අගනා සේවයක් කරන සාහිත්‍යධරයෙකි. තම අත්දැකීම් වෙනස් ආකාරයෙන් පාඨකයා වෙත රැගෙන යන අපූරු ප්‍රතිනිර්මාණීය වියමනකට උරුම කම් කියන උපසේන ඇට පුරුක් හි අඩංගු කෙටිකතා පහළොව මගින් ඔබත් මාත්, විඳින, විඳඇති, විඳින්නට සැරසෙන අත්දැකීම් රාශියක් අප අතරට රැගෙන එයි. එම සියල්ලම පාහේ පාඨකයාගේ සිත් බැඳගෙන ඇති ලෙසින් ලියැවී ඇති බව මගේ අදහසයි. ඔහුගේ නිර්මාණයන්හි මා වඩාත්ම සිත්ගත් කතා කිහිපයක් ඒ අතර ඇත. මා එයින් මුල් තැනක් දෙන්නේ "වියපත් සෙනහසක්" හා " මීනච්චී" නම් කෙටි කතා ද්විත්වයටයි. ඊට අමතරව මේ



පලු ගස නම් කෙටි කතාවද මගේ සිත තුළ ප්‍රකම්පනයක් ජනිත කළ බැව් කිව යුතුමය. කිසියම් සිද්ධියක් උත්ප්‍රාසය හා බද්ධ කරමින් කෙටි කතාවක් ගොතන්නට ඔහු සමතෙකි. කුකුල් ප්‍රාණය නම් කතාව එයට කදිම නිදසුනකි.

වියපත් සෙනෙහසක් නම් කතාව හරහා ආදරයක් තුළ ඇති ප්‍රබලත්වය හා බල සම්පන්න බව ඔහු ඒ චරිත හරහා කදිමට නිරූපණය කරයි. එය ආදරය හා ජීවිතය එකිනෙක යා කරන සෙනෙහෙවන්ත වියමනක් ලෙසින් ඔහු වදන් හා භාෂාව ගොඩ නඟා ඇති අයුරු අපූරුය. තම පුතුට වඩා ආදරය හා සෙනෙහස ලබන්නට තරම් වාසනාවන්ත වූ පියෙකු ගැන කතා කරන කතුවරයා අද වර්තමාන පරම්පරාවේ ආදරයට හිමි වී ඇති බේදවාදකය පිළිබඳව ඒ හරහා පාඨකයාට යම් ඉඟියක් ලබා දෙයි. ආදරය කිසි දිනෙක වියපත් නොවන බවත්, ජීවිතය වියපත් වී ගියද හදවත තුළ තෙරපෙන අවංක ආදරයට මේ විශ්වය තුළ සදාතනික ඉඩක් වෙන්වී ඇති බවත්, රචකයා මෙම කතාව තුළින් නිරූපිත කරයි.එසේම පාඨකයාගේ හිත් තුළ සැඟවී ඇති ආදර සිතුවිලිවලට ඔහු සියුම්ව අමතයි.

සාහිත්‍ය යනු ප්‍රබන්ධ කලාවකි. එය සත්‍යයක් කල්පිතයත් අතර දෝලනය වෙමින් ගලා යන අපූර්තවයෙන් පිරි සිද්ධි සමුදායකි. උපසේන මේ සියල්ල මැනවින් ග්‍රහණය කර ගනිමින් නිර්මාණය කර ඇති මීනච්චි නම් කෙටි කතාව උසස් කෙටි කතාවකට හිමි බොහෝ ලක්ෂණ ඇති බැව් කිව යුතුමය. අසුව දශකයේ කළු ජූලිය හා බද්ධව ලියැවී ඇති එම කතාව තුළින් ජාති ආගම් බේදයකින් තොරව ආදරයට හිමි, කළ හැකි දේ පිළිබඳවත්, එහි සැබෑ අරමුණ කුමක්ද යන්නත් පාඨකයාට මැනවින් පහදයි. තම දිවි පරදුවට තබමින් මීනාගේ ජීවිතය බේරාගත් පෙරේරා නමැති කාර්යාල කාර්ය සේවකයා තුළින් ආදරයේ සුන්දරත්වය කුමක්ද යන්න කතුවරයා අපට පහදා දෙයි. එලෙසම ජාතීන් අතර සමඟිය වෙනුවෙන්, මෙම විශ්වය මත ආදරයට කළ හැකි දේ පිළිබඳව ඔහු එම චරිත මඟින් විදහා දක්වයි. මීනා ඔස්ට්‍රේලියාවේ සිට එවනලද චොක්ලට් දවටනයේ හදවතත් සමඟ නතර වන කතාව තුළින් පාඨකයා තුළ ප්‍රකම්පනයක් ජනිත කිරීමට කතුවරයා සමත් වීම මෙහි ඇති අපූර්ත්වයයි. එම හදවත අසල රැඳෙන පෙරේරාගේ දෑස්වල ඇති කඳුළුත්, උණු වී ගලා හැලෙන චොකලට් රස විඳින ඔහුගේ දරුවන් අසල රැඳෙන අපේ කඳුළු පිරි දෑසත් මිහිරිතම වූ ආදරයක යටගියාව යළි පාඨකයා වෙත කැන්දාගෙන එයි. මීනච්චි කතාව තුළින් මා දකින ප්‍රධාන කාරණා වන්නේ ආදරය තුළින් ජාතින් අතර සංහිඳියාවට ඔහු හෙළන මානුෂීය බැල්මයි.

උපසේනගේ බොහෝ කෙටිකතා නිර්මාණය වී ඇත්තේ ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණයෙනි. ග්‍රන්ථයේ නමට යොදා ඇති ඇට පුරුක් නමැති කෙටි කතාව තුළින්, පියෙක් තම පුතුගේ ශරීර ශක්තිය ගැන වෙහෙසෙන අයුරු කියාපායි. තම දරු වාගේ ඇට පුරුක් තදවීමට නම් හොඳින් ආහාර ගතයුතු බව පියාගේ අදහසයි. ඔහු පුතු වෙනුවෙන් කැපවෙයි. එහෙත් පියා අවසානේ මිය යන්නේ දියර ආහාර වේලක් ලබාගන්නා ලෙඩෙකු ලෙසිනි. ජීවිතයේ නිස්සාරත්වය විදහාපාන මෙම කතාව ඔහු අවසන් කරන්නේ මෙලෙසිනි.

"ඔය නවීන විද්‍යාවේ බහුබූත බං... පිරිමි උනාම ඇට පුරුක් තදවෙන්න කන්න ඕනේ" තාත්තා කොහේදෝ සිට මුමුණනු මට ඇසෙයි.

ඔහුගේ "මේ පලුගස" කතාවද අපූර්ත්වයෙන් පිරි වියමනක් ලෙසින් සඳහන් කිරීමට මම කැමැත්තෙමි. ගැටවර වියේ පලු ගසේ සෙවණට පෙම් බඳින කතා නායකයා පලුගහ යට පෙම් සුව විඳින ප්‍රේමවන්තයින්ගේ ලෝකයට පෙම් බඳින අයුරුත් ඔහු ගමෙන් ඈත් වී කාලයක් පුරාවෙන් වී නැවත ගමට එනවිට පලු රස නීරස වී, දේශපාලනික භීෂණ හැලහැප්පීම් මැද සියල්ල ඈත් වී යන අයුරුත් පාඨකයාට කියයි. එහෙත් මේ සියලු රහස් හා කම්පනයන් විඳ දරාගනිමින් තවමත් පලු ගස එල දරයි.

"සතෙක් සිව්පාවෙක් වත් දැන් මේකේ ගෙඩි කන්න එන්නේ නැහැ මහත්තයො. ඒව හරිම උගරලු රහයි." මිනිසුන් විසින් අතහැර දැමු ස්වාභාව ධර්මයට තවමත් ළං වූ පලු ගස, මිනිසා දේශපාලනික සත්වයෙක් බව කියාපාමින් පාඨකයාගේ හදවතට අමතන කෙටි කතාවකි.

සමහර කෙටි කතා තුලින් කෙටි කතාවක තිබිය යුතු ලක්ෂණවල අඩුවක් දක්නට ලැබුණිද. කතාවේ රස වින්දයට එයින් හානියක් නොමැතිව ගලායන බව මගේ හැඟීමයි. එය ඔහුගේ ලේඛන භාෂාවේ සමත්කමයි. ඩබ්. උපසේන යනු අප අතර සිටිය යුතු ඩයස්පෝරා සාහිත්‍යයට මාහැඟි සේවයක් කළ හැකි ලේඛකයෙකි. ඔහුගේ ප්‍රතිභාව හා පරිණත අත්දැකීම් තුළින් නවකතාවක් එළි දැක්වීමට කාලය ඇවිත් බව මගේ අදහසයි. ඇට පුරුක් රසවිඳිය හැකි අගනා ග්‍රන්ථයක් බව සඳහන් කරමින් ඔහුගේ ලේඛන දිවියට මම සුබ පතමි.




